# මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
## පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සති අන්ත) පාඨමාලාව 2025
## (සිංහල /ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යය) සඳහා අයදුම්පත් කැඳවීම

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව සැළසුම් කර ඇත්තේ රජයේ පාසල්වල සහ අනෙකුත් අධ්‍යාපන ආයතන වල සේවය කරන උපාධිධාරී ගුරුවරුන්ගේ දැනුම සහ කුසලතා ඉහළ නැංවීම සඳහාය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වය ඇතිකිරීමට අවශ්‍ය නිපුණතා වලින් ගුරුවරුන් සන්නද්ධ කිරීම මෙම වැඩසටහනේ අරමුණයි.

**පාඨමාලාවට අයදුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම්**

- පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු වීම.
- අවම වශයෙන් ගුරුවරයකු වශයෙන් වසරක සේවා පළපුරුද්දක් තිබීම.

**සටහන :**

- සැ. යු. පාඨමාලාව සඳහා තෝරාගැනීමේදී රජයේ පාසලක හෝ අනෙකුත් අධ්‍යාපන ආයතනයක උපාධිධාරී ගුරුවරයෙකු ලෙස හෝ පරිපාලන සේවයේ නිරත වන අයට ප්‍රමුඛතාව දෙනු ලැබේ.

බඳවා ගැනීමට අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා වැඩි අයදුම්පත් සංඛ්‍යාවක් ලැබුනොත් පශ්චාත් උපාධි ආයතනය මඟින් ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලබන අතර එම පරීක්ෂණයේදී අයදුම්කරුවන් විසින් ලබාගන්නා ලකුණු ප්‍රමුඛතාවය අනුව සුදුස්සන් තෝරා ගැනීම සිදුකෙරේ.

**අයදුම්පත් ලබා ගැනීමේ ක්‍රම වේදය :**

**අයදුම්පත් ලබාගැනීම සඳහා :**

1. ඉල්ලුම්කරු නම සහ ලිපිනය සහිතව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අංක 057 1001 6002 7421 දරණ මහජන බැංකු ගිණුමට රු 2000.00 ක මුදලක් බැර කර එහි ලදුපත පශ්චාත් උපාධි ආයතනයට ඉදිරිපත් කරන්න.

2. අදාල මුදල ගෙවූ ලදුපත සහිතව තම නම සහ ලිපිනය ලියන ලද රු 110.00ක මුද්දර ඇලවූ 22×10cm ප්‍රමාණයේ ලියුම් කවරයක් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය (20400) යන ලිපිනයට එවීම මඟින් ද අදාල අයදුම්පත ලබාගත හැකිය.

3. www.pgihs.ac.lk වෙබ් පිටුවට පිවිසීමෙන් අයදුම්පත ලබාගත හැකිය.

පාඨමාලා ගාස්තු : රු. 107,000.00 කි.
(ලියාපදිංචි ගාස්තු: 5000 + පාඨමාලා ගාස්තු : 100,000 + පුස්ථකාල ගාස්තු : 2,000)
පාඨමාලා ගාස්තුවෙන් 50% ක මුල් ලියාපදිංචි සමඟ ගෙවිය යුතු අතර ඉතිරිය කොටස් දෙකකින් අවසාන විභාගයට පෙර ගෙවිය යුතුය.
පුස්තකාල තැන්පතුව : රු. 2000.00 කි. (පාඨමාලාව අවසන් කළ පසු එම මුදල ආපසු ලබාගත හැකිය.)

**වැඩි විස්තර සඳහා - 081 2388957**

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනය: 2025 පෙබරවාරි 15.**

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.